සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
# First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## පුරවැසි අධ්‍යාපනය - I

පැය එකයි
One hour

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01 සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලන කටයුතු සිදු වූ ග්‍රීක පෞර රාජ්‍යය වන්නේ,
(1) උෘර් ය. (2) මල්ල ය. (3) ඇතන්ස් ය. (4) තීබ්ස් ය.

02 නිදහස් ජනමාධ්‍යය මගින් සිදු විය යුතු කාර්යයක් වන්නේ මින් කවරෙක් ද?
(1) පාලකයින්ට පක්ෂපාතීව කටයුතු කිරීම
(2) ජනතාවට සත්‍ය හා නිවැරදි තොරතුරු සැපයීම
(3) පාලනය ක්‍රමවත්ව හා අපක්ෂපාතීව සිදු කිරීම
(4) පුරවැසි අයිතිවාසිකම් පාලකයන් වෙත දැනුම් දීම

03 ජනාධිපති ආණ්ඩුක්‍රමයක විධායකයේ ප්‍රධානියා වන්නේ,
(1) අගමැති ය. (2) ජනාධිපති ය. (3) කැබිනට් මණ්ඩලය යි. (4) ආණ්ඩුකාරවරයා ය.

04 රටක නීතිය හා සාමය අරක්ෂා කරමින් පුරවැසියන් පොදු අරමුණක් කරා මෙහෙයවන ආයතනය කුමක් ද?
(1) විධායකය (2) ව්‍යවස්ථාදායකය (3) ත්‍රිවිධ හමුදාව (4) ආණ්ඩුව

05 ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ක්‍රමයක ජනතාව සතු බලය,
(1) ස්වාධිපත්‍යය යි. (2) පරමාධිපත්‍යය යි.
(3) ආධිපත්‍යය යි. (4) නීත්‍යානුකූලත්වය යි.

06 ශ්‍රී ලංකාවේ පරිපාලන බලතල විමධ්‍යගත කිරීමේ දී ජාතික මට්ටම නියෝජනය වන තනතුර වන්නේ මින් කුමක් ද?
(1) අමාත්‍යංශ ලේකම් (2) ග්‍රාම නිලධාරී (3) ප්‍රධාන අමාත්‍ය (4) දිස්ත්‍රික් ලේකම්

- 07 - 08 ප්‍රශ්න සඳහා පහත ප්‍රකාශ උපයෝගී කර ගන්න.

A - සියලු ජන කොටස් පොදු හැඟීමකින් කටයුතු කිරීම
B - විවිධත්වය තුළ එක්සත් බවක් ඇති කිරීම
C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම
D - පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය ඒකක වෙත ලබා දීම

07 නූතන රාජ්‍යයන්හි බලය බෙදා හැරීමට බලපා ඇති හේතුවක් දක්වෙන්නේ කවර ප්‍රකාශයෙන් ද?
(1) B (2) C (3) D (4) A

08 සන්ධීය රාජ්‍යයක ලක්ෂණ දක්වෙන ප්‍රකාශයන් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) A හා C (4) C හා D

09 පළාත් සභාවක ආණ්ඩුකාරවරයාගේ නිල කාලය කොපමණ ද?

(1) වසර දෙකකි (2) වසර හතරකි (3) වසර පහකි (4) වසර හයකි

- ව්‍යවස්ථාදායකය කොංග්‍රස් මණ්ඩලය නම් වීම
- විධායක බලය ජනාධිපතිවරයා සතු වීම
- ජනපද දහතුනකින් ආරම්භ වීම

10 ඉහත කරුණු හා සම්බන්ධ සන්ධීය රාජ්‍යය කුමක් ද?

(1) ස්විස්ටර්ලන්තය (2) ඉන්දියාව
(3) ඔස්ට්‍රේලියාව (4) ඇමරිකා එක්සත් ජනපදය

11 රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීම කෙරෙහි බලපා ඇති හේතුවක් නොවන්නේ,

(1) අල්ලස හා දූෂණය ඉහළට යාම (2) රාජ්‍යය පාලනය අකාර්යක්ෂම වීම
(3) විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම (4) රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොර වීම

12 ඕනෑම අර්ථ ක්‍රමයකට මූලික ආර්ථික ප්‍රශ්න වලට මුහුණ පෑමට සිදු වන්නේ ........................ නිසා ය.

(1) වුවමනා (2) අවශ්‍යතා (3) සම්පත් (4) හිඟකම

13 නිෂ්පාදනයේ දී පිරිවැයක් දැරීමටත් පරිහරණය සඳහා මිලක් ගෙවීමටත් සිදුවන භාණ්ඩ හැඳින් වෙන්නේ,

(1) ආර්ථික භාණ්ඩ ලෙසය (2) නොමිළ භාණ්ඩ ලෙසය
(3) අන්තර් භාණ්ඩ ලෙසය (4) පාරිභෝගික භාණ්ඩ ලෙසය

14 නිෂ්පාදන සාධකයක් වූ ප්‍රාග්ධනය සඳහා ලැබෙන ප්‍රතිලාභය,

(1) බදු කුලිය යි. (2) ලාභය යි. (3) වැටුප යි. (4) පොලිය යි.

15 සමාජවාදී වෙළඳපොළ ලක්ෂණ බහුලව දක්නට ලැබෙන රට මින් කවරක් ද?

(1) ශ්‍රී ලංකාව (2) උතුරු කොරියාව (3) උතුරු ඇමරිකාව (4) සිංගප්පූරුව

16 ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියට අනුව ගැටුමට මුල්වන සමාජ, ආර්ථික, දේශපාලන වාතාවරණය පැහැදිලි කරනුයේ,

(1) ආකල්ප තුළින් ය. (2) චර්යාව තුළින් ය.
(3) සන්දර්භය තුළින් ය. (4) උපදේශනය තුළින් ය.

17 අන්තර් ජාතික ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන සාධක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) විවිධ අදහස් හා ආකල්ප (2) ආර්ථික ප්‍රතිලාභ හා බල ව්‍යාප්තිය
(3) බල ව්‍යාප්තිය හා කුලය (4) ආගම හා රාජ්‍ය ප්‍රතිපත්ති

18 ගැටුම් නිරාකරණයේ දී පුද්ගලයකු සතු විය යුතු සමාජීය ගුණාංගයක් වන්නේ,

(1) සහානුභූතිය යි. (2) මුදිතාව යි.
(3) ඉවසීම යි. (4) ආත්මාවබෝධය යි.

19

| I | | II | |
|---|---|---|---|
| 1. | දරිද්‍රතාවය | A | අයර්ලන්තය |
| 2. | නිකාය භේදය | B | දකුණු අප්‍රිකාව |
| 3. | දේශ සීමා | C | ඉතියෝපියාව |
| 4. | කායික ස්වභාවය | D | ඊශ්‍රායලය |

ඉහත I තීරුවේ සඳහන් මූලයන් නිසා ගැටුම් ඇති වූ අවස්ථාවන්ට මුහුණ දුන් රටවල් II තීරුව සමඟ ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ACBD (2) ADCB (3) BADC (4) CADB

20 ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන **මූලිකම** ක්‍රම වේදය වන්නේ,

(1) සාකච්ඡාව යි. (2) මැදිහත්කරණය යි. (3) විනිසීමයි (4) බේරුම්කරණය යි.

21 නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,

(1) මානව අයිතිවාසිකම් ආරක්‍ෂා කර සුරක්ෂිත කිරීමයි.

(2) දේපළ හා ජීවිත ආරක්ෂාව ඇති කරලීමයි.

(3) සාමය ඇති කිරීම තුළින් සහජීවනය ඇති කිරීමයි.

(4) මානව හැසිරීම් පාලනය තුළින් යුක්තිය ඇති කිරීමයි.

22 ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා

(1) ජනාධිපතිතුමා වේ. (2) අග්‍ර විනිශ්චයකාරතුමා වේ.

(3) නීතිපතිතුමා වේ. (4) අධිකරණ ඇමතිතුමා වේ.

- 23 - 24 ප්‍රශ්න සඳහා උපයෝගී කරගන්න.

A රාජ්‍ය විරෝධි කුමන්ත්‍රණ නඩු B දරුකමට හදා ගැනීම පිළිබඳ ඉල්ලීම්

C විවාහ සම්බන්ධ නඩු D මැතිවරණ සම්බන්ධ නඩු

E විශාල මංකොල්ලකෑම් පිළිබඳ නඩු

23 මහාධිකරණය සතු අධිකරණ බලතල දැක්වෙන්නේ ඉහත කවර ප්‍රකාශ වලින් ද?

(1) A හා C (2) A හා E (3) B හා C (4) B හා E

24 "D" ප්‍රකාශයෙන් දැක්වෙන නඩු විසඳීමේ බලතල පැවරී ඇත්තේ කුමන උසාවියට ද?

(1) දිසා අධිකරණයට (2) මහේස්ත්‍රාත් අධිකරණයට

(3) අභියාචනාධිකරණයට (4) මහාධිකරණයට

25 කාර්මික ආරවුල් විසඳීම සඳහා පිහිටුවා ඇති අධිකරණ ආයතනය වන්නේ,

(1) කාති උසාවිය යි. (2) ගෙවල් කුලී මණ්ඩය යි.

(3) කම්කරු විනිශ්චය සභාවයි. (4) මාර්ග සංවර්ධන අධිකාරිය යි.

26 ලන්දේසි පාලන සමයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුන වන්නේ,

(1) මාතර, කොළඹ, යාපනය යි. (2) ගාල්ල, කොළඹ, යාපනය යි.

(3) කොළඹ, කුරුණෑගල, මාතර යි. (4) කොළඹ, ගම්පහ, කළුතර යි.

27 වර්තමානයේ තේසවලාමේ නීතිය ක්‍රියාත්මක වන්නේ, කවර ප්‍රදේශවල ජීවත්වන දමිළ වැසියන් හට ද?

(1) උතුරු පළාත හා කොළඹ දිස්ත්‍රික්කයට ය.

(2) මධ්‍යම පළාත හා යාපනය දිස්ත්‍රික්කයට ය.

(3) සබරගමු පළාත හා මන්නාරම දිස්ත්‍රික්කයට ය.

(4) උතුරු පළාත හා මන්නාරම දිස්ත්‍රික්කයට ය.

28 සේවක හා සේවා යෝජකයන් අතර ඇතිවන ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීමට කටයුතු කිරීමේ ක්‍රම වේදය,

(1) බේරුම්කරණය වේ. (2) සමථකරණය වේ.

(3) විනිසීම වේ. (4) මැදිහත්කරණය වේ.

29 අධිකරණ කටයුතු සඳහා ලාංඡනයක් ලෙස යොදා ගෙන ඇති දෙවගන

(1) සියුස් (2) ඇතීනා (3) හෙරානා (4) එන්කිකී

30 සාර්ව ගැටුම් යනුවෙන් හඳුන්වන්නේ,

(1) පුද්ගලයන් අතර ඇතිවන ගැටුම්කාරී තත්වයන්ය.

(2) පවුල් අතර ඇති වන ගැටුම්කාරී තත්වයන්ය.

(3) ජාත්‍යන්තර වශයෙන් ඇතිවන ගැටුම්කාරී තත්වයන් ය.

(4) ජාතික මට්ටමින් ඇතිවන ගැටුම්කාරී තත්වයන්ය.

31 පරිපාලනය සම්බන්ධ විශේෂ කොමසාරිස් තනතුර හෙවත් ඔම්බුඩ්ස්මන් ධූරය හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩු ක්‍රමයෙන් ද?

(1) 1931 ඩොනමෝර් (2) 1947 සෝල්බරි (3) 1972 පළමු ජනරජ (4) 1978 දෙවන ජනරජ

32 මූර්ත ජාතික නිෂ්පාදනයේ වසරින් වසර සිදුවන වැඩිවීමේ ප්‍රතිශතය,

(1) ආර්ථික වර්ධනය යි. (2) සමාජ සංවර්ධනනය යි.

(3) තිරසර සංවර්ධනය යි. (4) පුද්ගල වර්ධනය යි.

33 නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා නැවත, නැවත භාවිතයට ගත හැකි භාණ්ඩ ......... ලෙස වර්ග කළ හැකි වේ.

(1) පාරිභෝගික භාණ්ඩ (2) අන්තර් භාණ්ඩ

(3) ප්‍රාග්ධන භාණ්ඩ (4) වෙළඳ භාණ්ඩ

34 පහත I තීරුවේ දැක්වෙන ආණ්ඩුක්‍රම සමග II තීරුවේ දැක්වෙන ප්‍රතිසංස්කරණ නිවැරදිව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| I | | II | |
|---|---|---|---|
| 1. | කෝල්බෘක් | A | සීමිත ඡන්ද බලය |
| 2. | කෲව් මැකලම් | B | පළාත් බද ඡන්ද කොට්ඨාස |
| 3. | මැනිං | C | ව්‍යවස්ථාදායක සභාව |
| 4. | ඩොනමෝර් | D | කැබිනට් ආණ්ඩු ක්‍රමය |
| | | E | රාජ්‍ය මන්ත්‍රණ සභාව |

(1) ACBD (2) BACD (3) CABE (4) DABC

35 අනුරාධපුර පාලන සමය අග භාගය වන විට අප රට බෙදී පැවති දේශපාලන ඒකක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) උත්තර පස්ස, දක්ඛිණ දේශය, මලය රට (2) දිසාව, කෝරළය, පත්තුව

(3) රජරට, රුහුණු රට, මලය රට (4) අටදහස් රට, දොළොස් දහස් රට, රුහුණු රට

36 වර්තමානයේ ශ්‍රී ලංකාව බෙදා ඇති පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව,

(1) විසි පහකි (2) විසි හතරකි (3) විසි දෙකකි (4) නවයකි

37 A පුත්තලම B අම්පාර C මඩකලපුව D බදුල්ල

E කුරුණෑගල

ඉහත සඳහන් දිස්ත්‍රික්ක අතුරෙන් වයඹ පළාතට අයත් වන්නේ,

(1) A හා E ය. (2) B හා D ය. (3) C හා E ය. (4) D හා E ය.

38 මැතිවරණයකින් පසු තේරී පත්වන පාර්ලිමේන්තුවේ ප්‍රථම කාර්යය වන්නේ,

(1) කථානායකවරයෙකු පත් කර ගැනීමයි. (2) මහ ලේකම්වරයෙකු පත් කර ගැනීමයි.

(3) අගමැතිවරයෙකු පත් කර ගැනීමයි (4) ජනාධිපතිවරයා පත් කර ගැනීමයි.

39 එක් මධ්‍යම ආණ්ඩුවක් තුළ බලය ඒකරාශීවීම ඇත්තේ,

(1) ඒකාධිපති ආණ්ඩු ක්‍රමයක ය. (2) සන්ධීය ආණ්ඩු ක්‍රමයක ය.

(3) රාජාණ්ඩු ක්‍රමයකය (4) ඒකීය ආණ්ඩු ක්‍රමයකය.

40 ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ධනාත්මක බලපෑමක් වන්නේ,

(1) විදේශ ණය මත යැපීමට සිදු වීම (2) නවීන තාක්ෂණය ගලා ඒම

(3) දේශීය සම්පත් සූරා කෑමට ලක් වීම (4) බුද්ධිගලනය වේගවත් වීම

( ලකුණු 1 x 40 )

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## පුරවැසි අධ්‍යාපනය - II

පැය දෙකයි
Two hours

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ස්වරූප දෙක නම් කරන්න.

(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ දෙකක් ලියන්න.

(iii) ජාතික රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න.

(iv) බලය යන සංකල්පයේ විවධ ස්වරූප දෙකක් සඳහන් කරන්න.

(v) සන්ධීය ආණ්ඩුක්‍රමය පවත්නා රටවල් දෙකක් නම් කරන්න.

(vi) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන වාසි දෙකක් ලියන්න.

(vii) දේශිය නීතියේ ප්‍රභේද දෙකක් සඳහන් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ නීතිපතිතුමාගේ බලතල හා කාර්යයන් ඉටු කිරීමට සහය වන නිලධාරීන් දෙදෙනකු නම් කරන්න.

(ix) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් බෙදා දැක්විය හැකි ප්‍රධාන තේමා වලින් දෙකක් සඳහන් කරන්න.

(x) මහනගර සභාවලට පැවරී ඇති බලතල දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(03) (i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ජන සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයක පුරවැසියෙකු වශයෙන් ඔබ විසින් ප්‍රගුණ කළ ගුණාංග තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04) (i) පරිවර්තන ආර්ථිකයන් හි දැකිය හැකි මූලික ලක්‍ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ පෞද්ගලික ව්‍යවසායන් දිරි ගැන්වීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) වර්තමානයේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති තුළින් ශ්‍රී ලංකාවට අත්වන වාසි තුනක් සඳහක් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05) (i) නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) නීතියේ ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ වර්තමාක අධිකරණ පද්ධතිය තුළ පවතින අධිකරණ තුනක් ද,

(b) විශේෂ පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති අධිකරණ බලතල සහිත ආයතන දෙකක් ද පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 05)

06) (i) ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් වූ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් ලබා දුන් වැදගත් යෝජනා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් තුන්ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07) (i) ශ්‍රී ලංකාව බලය විමධ්‍යගත කිරීම කෙරෙහි බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බලය විමධ්‍යගත කිරීමේදී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන තුනක් සඳහන්කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)